// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 1833/26 - 2013 ඔක්තෝබර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2013.10.24
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකශන ආදිය

එල්. ඩී. බී. 63/51(II).

### අතිගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

මහින්ද රාජපක්ෂ

ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, (284 වන අධිකාරය වූ) ශ්‍රී ලංකා දුම්රිය නිළැ'ඳුම් සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ 16 වන වගන්තිය මගින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, මෙම රීතියේ විධිවිධාන වර්ෂ දෙදහස් දහතුනක් වූ සැප්තැම්බර් මස 30 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවට මෙම ප්‍රකාශනයෙන් ප්‍රකාශ කර සිටිමි.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජනාධිපති ලේකම්.

2013 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

එල්.ඩී.බී. 63/51(II)

### ශ්‍රී ලංකා දුම්රිය නිළැ'ඳුම් සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත

(284 වන අධිකාරය වූ ) ශ්‍රී ලංකා දුම්රිය නිළැ'ඳුම් සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ 16 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා දුම්රිය නිළැ'ඳුම් සේවා අර්ථසාධක අරමුදල නම් වූ සංස්ථාව විසින් සාදනු ලැබ, ජනාධිපතිවරයා විසින් එම වගන්තිය යටතේ ඔහු වෙත පැවරී ඇති බලතල යටතේ ස්ථිර කරනු ලැබූ රීති.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති

2013 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

1A - G 18426— 160 (2013/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**රීති**

කලින් කල සංශෝධිත සහ අවසන්වරට 2009 ඔක්තෝබර් මස 12 වැනි දින අංක 1623/5 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද රීතීය මගින් සංශෝධිත, 1984 ජූලි මස 6 වැනි දින අංක 305 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රීති, පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

1. (15). වන රීතිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් රීතිය ආදේශ කිරීමෙන් :–

"යැපෙන්නන් සඳහා මරණාධාර.

(15.)1 (*අ*) සාමාජිකයාගේ කලත්‍රයා, වයස අවුරුදු 18 ට අඩු අවිවාහක පුතකු, කවර හෝ වයසක අවිවාහක දියණියක, සාමාජිකයාගේ දෙමව්පියන්ගෙන් කෙනෙකු, කලත්‍රයාගේ දෙමව්පියන්ගෙන් කෙනෙකු හෝ උපතේ දී දරුවකු මියගිය අවස්ථාවක දී එම සාමාජිකයා විසින් මරණ සහතිකය ද සමග කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත මරණ පාරිතෝෂික වශයෙන් රුපියල් විසි දහසක (රු.20,000/-) මුදලක් සාමාජිකයාට ගෙවනු ලැබිය යුතු ය.

(*ආ*) (අ) ජේදය යටතේ ගෙවනු ලබන මරණ පාරිතෝෂික මුදල සමාන කොටස් වලින් පොදු සාමාජිකත්වයෙන් අයකර ගනු ලැබිය යුතු ය.

15.2 (*අ*) සාමාජිකයා විසින් (15) 1 (අ) උපජේදයේ සඳහන්ව ඇති ලිඛිත ඉල්ලීම සමඟ –

(i) කලත්‍රයාගේ මරණය සම්බන්ධව මරණ පාරිතෝෂිකය ඉල්ලා සිටීමේ දී සාමාජිකයාගේ විවාහ සහතිකය ;

(ii) මියගිය දරුවකු සම්බන්ධව මරණ පාරිතෝෂිකය ඉල්ලා සිටීමේ දී මියගිය දරුවාගේ උප්පැන්න සහතිකය ;

(iii) දෙමව්පියන්ගේ මරණයක් සම්බන්ධව මරණ පාරිතෝෂික ඉල්ලා සිටීමේ දී සාමාජිකයාගේ උප්පැන්න සහතිකය ;

(iv) කලත්‍රයාගේ දෙමව්පියන්ගේ මරණයක් සම්බන්ධව මරණ පාරිතෝෂික ඉල්ලා සිටීමේ දී කලත්‍රයාගේ උප්පැන්න සහතිකය සහ සාමාජිකයාගේ විවාහ සහතිකය ; හෝ

(v) උපතේ දී මියගිය දරුවකුගේ මරණයක් සම්බන්ධව මරණ පාරිතෝෂික ඉල්ලා සිටීමේ දී උපතේ දී මියගිය දරුවාගේ මලදරු උපත් සහතිකය,

ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(*ආ*) ඉහත 1 ජේදයේ (අ) අනුජේදයේ සහ 2 වන ජේදයේ (අ) අනුජේදයේ දක්වා ඇති ලේඛන සමග පහත දක්වා ඇති ලේඛන සාමාජිකයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :–

(i) සේවා ස්ථානභාර ප්‍රධානියාගේ සහතිකය ; සහ

(ii) මියගිය තැනැත්තා සහ සාමාජිකයා අතර ඇති ඥාති සම්බන්ධතාවය සහතික කරමින්, එම සාමාජිකයා ස්ථිරව පදිංචිව සිටින ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අනු අත්සන් තබන ලද ග්‍රාම නිලධාරි වරයාගෙන් ලබාගත් ලිපියක්.

(*ඇ*) (i) 1 වන ජේදයේ (අ) අනුජේදයේ සහ 2 වන ජේදයේ (අ) සහ (ආ) අනුජේදවල දක්වා ඇති ලේඛන සංස්ථාව සෑහීමකට පත්වන ආකාරයට ඉදිරිපත් කරන තෙක් මෙම ජේදය යටතේ මරණ පාරිතෝෂික ගෙවනු නොලැබිය යුතු ය.

(ii) සංස්ථාව සෑහීමකට පත්වන ආකාරයට අදාළ සහතික ලබාගැනීමට හෝ ඉදිරිපත් කිරීමට සාමාජිකයා අපොහොසත් වන අවස්ථාවක, සාමාජිකයා සහ මියගිය තැනැත්තා අතර ඥාති සම්බන්ධතාවය තහවුරු කිරීම සඳහා වෙනත් ලේඛන ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමට සංස්ථාවට අයිතියක් ඇති අතර අදාළ ලේඛන සංස්ථාව සෑහීමට පත්වන ආකාරයෙන් ඉදිරිපත් කළ පසු පමණක් මරණ පාරිතෝෂිකය ගෙවනු ලැබිය යුතු ය.

(*ඈ*) පෙර විවාහයේ කලත්‍රයාගේ මරණින් පසු හෝ පෙර විවාහයක් විසුරුවා හැරීමෙන් පසු නැවත විවාහ වූ සාමාජිකයකුගේ කලත්‍රයාගේ මරණය වෙනුවෙන් හෝ කලත්‍රයාගේ දෙමව්පියන්ගේ මරණ වෙනුවෙන් පෙර විවාහයේ දී මරණ පාරිතෝෂික ලබාගෙන ඇත්නම් දෙවන වරටත් ඒ වෙනුවෙන් මරණ පාරිතෝෂික ගෙවනු නොලැබිය යුතු ය.

15.3 මරණ පාරිතෝෂිකය සඳහා හිමිකම්පෑමේ අයිතිය සියළු සුදුසුකම් ඇති සාමාජිකයකුගේ යැපෙන්නන්ට ඇත්තේ ය.

15.4 (අ) සාමාජිකයකු විසින් මරණ පාරිතෝෂිකයක් සඳහා වූ හිමිකම් පෑම මරණය සිදු වූ දින සිට දින 90 ක් ඇතුළත පාලන කාරක සභාව වෙත සිදු කළ යුතු අතර, මියගිය තැනැත්තා සහ සාමාජිකයා අතර ඇති ඥාති සම්බන්ධතාවය මරණය සිදු වී දින 180ක් ඇතුළත ඔප්පු කරනු ලැබිය යුතු ය. අදාළ දින 90 කාලසීමාවෙන් පසුව ලැබුණු ඉල්ලුම් පත්‍ර පිළිගනු නොලබන අතර, අදාළ දින 180 කාල සීමාව තුළ ඥාති සම්බන්ධතාවය ඔප්පු කිරීමට අපොහොසත් වන සාමාජිකයකුට මරණ පාරිතෝෂිකය ගෙවනු නොලැබිය යුතු ය.

(ආ) 8 වන රීතියේ 2 වන ඡේදයේ (අ) අනුඡේදය යටතේ සාමාජිකත්වය අත්හිටුවනු ලැබූ කාලසීමාව තුළ යම් සාමාජිකයකු මිය යන අවස්ථාවක, අදාළ සාමාජිකයාගේ සාමාජිකත්වය අත්හිටවූ අවස්ථාවේ පවතින මරණ පාරිතෝෂිකයෙන් 50% ක් 14 වන රීතියේ 2 වන ඡේදයේ විධිවිධාන වලට යටත්ව ඔහුගේ යැපෙන්නන්ට ගෙවනු ලැබිය යුතු ය.

(ඇ) සාමාජිකයකුගේ සාමාජිකත්වය අත්හිටුවා ඇති කාලය තුළ දී අදාළ සාමාජිකයාගේ යැපෙන්නකු මියගිය අවස්ථාවක මරණ පාරිතෝෂිකය ගෙවීම සම්බන්ධයෙන් 8 වන රීතියේ 4 වන ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

15.5 (අ) විශ්‍රාම ගනු ලබන අවස්ථාව තෙක් කිසිදු මරණ පාරිතෝෂිකයක් ලබා නොගත් සාමාජිකයකු වෙත ඔහු විසින් ගෙවන ලද මරණ පාරිතෝෂික දායක මුදල් වාරික සමග වාරිකවල එකතුවෙන් සියයට දහයක් පොළියක් ලෙස ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(ආ) මරණ පාරිතෝෂිකය සම්බන්ධයෙන් වූ සියළු අයකිරීම් මරණ පාරිතෝෂික ගිණුමට බැරකොට පොත්වල වෙන වෙනම පෙන්විය යුතු ය.

15.6 සංස්ථාව විසින් එහි වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට දහයක් මරණ පාරිතෝෂික ගිණුමට බැර කළ යුතු ය.

15.7 මරණ පාරිතෝෂික ගිණුමේ බැරට ඇති මුදල්, රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතුවක තැන්පත් කරනු ලැබිය යුතු ය.

15.8 7 වන ඡේදයේ සඳහන් වන ස්ථාවර තැන්පතුවෙන් ලැබෙන පොළිය –

(අ) 15 වන රීතියේ (5) ඡේදයේ (අ) අනුඡේදය යටතේ සාමාජිකයකුට මුදල් ආපසු ගෙවීමට ; සහ

(ආ) 14 වන රීතියේ 2 වන ඡේදය යටතේ මරණ පාරිතෝෂික වල යම් ප්‍රතිශතයක් (සංස්ථාව මගින් තීරණය කරනු ලැබිය යුතු වන) ගෙවීමට, පමණක් උපයෝගී කොට ගනු ලැබිය යුතු වන්නේ ය.".

2. (18) වන රීතියෙහි 4 වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :–

"පාරිතෝෂික ආරක්ෂක අරමුදල.

18.5 ආඥාපනතේ 23 වන වගන්තිය අනුව පාරිතෝෂික ආරක්ෂක අරමුදල වශයෙන් රුපියල් ලක්ෂ දහයක (රු.10,000,00/-) මුදලක් වෙනමම ගිණුමක තැන්පත් කළ යුතු ය. එකී ආරක්ෂක අරමුදල රාජ්‍ය බැංකුවක තැන්පත් කර එයින් ලැබෙන පොළිය ඒ ඒ වර්ෂය තුළ ගෙවනු ලබන පාරිතෝෂික සඳහා යොදා ගත යුතු ය.".

3. 19 වන රීතිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් රීතිය ආදේශ කිරීමෙන් :–

"ගෞරව පාරිතෝෂිකය.

(19.)1 (8.)1 රීතිය යටතේ යම් සාමාජිකයකුට සංස්ථාවේ සාමාජිකත්වය අහිමිවන අවස්ථාවක, එකී සාමාජිකයාට හයමසක් ගත වන තෙක් මසකට රුපියල් දස දහසක් (රු.10,000/-) බැගින් (මෙහි මින්මතු "ගෞරව පාරිතෝෂිකය" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්‍රාම ගැනීමේ ගෞරව පාරිතෝෂිකයක් වශයෙන් එකතුව රුපියල් හැට දහසක් (රු.60,000/-) මුදලක් ගෙවනු ලැබිය යුතු ය.

19.2 ගෞරව පාරිතෝෂිකය ගෙවීම (5.) රීතියේ 1 වන ඡේදය යටතේ මාසික දායක මුදල් ගෙවීමට සහ (18.) වන රීතිය යටතේ පාරිතෝෂික මුදල් ගෙවීමට පසුව එළඹෙන ලිත් මාසයෙන් ආරම්භ විය යුතු ය.

19.3 ගෞරව පාරිතෝෂිකය හෝ එහි යම් කොටසක් ගෙවීමේ දී එවැනි සෑම ගෙවීමක් ම එම සාමාජිකයාගේ නමින් ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කරනු ලැබිය යුතු ය.

19.4 (අ) ගෞරව පාරිතෝෂිකයක් සඳහා හිමිකම් ලැබීමට කැමති සෑම සාමාජිකයකුම මසකට රුපියල් දෙසිය පනහ (250/-) බැගින් වර්ෂයකට රුපියල් තුන්දහසක (3,000/-) දායක මුදලක් ගෙවිය යුතු ය. ගෞරව පාරිතෝෂික සම්බන්ධයෙන් වූ සියලු අයකිරීම් රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතුවක තැන්පත් කරනු ලැබිය යුතු ය. ස්ථාවර තැන්පතුවෙන් ලැබෙන පොළිය ගෞරව පාරිතෝෂික ඉතිරි කිරීමේ ගිණුමට බැර කරනු ලැබිය යුතු අතර එය ගෞරව පාරිතෝෂික ගෙවීමට උපයෝගී කර ගත යුතු ය.

(ආ) වසර දහයක සාමාජිකත්වයක් සම්පූර්ණ කරන ලද සහ ගෞරව පාරිතෝෂික වාරික 120 ක් ගෙවා අවසන් කරන ලද සාමාජිකයකු (19.) වන රීතියේ 1 වන ජේදය යටතේ ගෞරව පාරිතෝෂිකය ලැබීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

(ඇ) ගෞරව පාරිතෝෂිකයට හිමිකම් ඇති සංස්ථාවේ සාමාජිකයකුගේ සාමාජිකත්වය 8. රීතියේ 2 වන ජේදයේ (අ) අනුජේදය යටතේ අත්හිටුවනු ලැබ (8.) වන රීතියේ 1 වන ජේදය යටතේ ඔහුගේ සාමාජිකත්වය අහිමිවන අවස්ථාවක, 19. වන රීතියේ 2 වන ජේදයේ විධිවිධාන සපුරාලීමේ දී සහ ගෞරව පාරිතෝෂිකයේ හිඟ වාරික මුදල් ගෙවීමේ දී පමණක් ඔහුට ගෞරව පාරිතෝෂිකයකට හිමිකම් ලැබිය යුතු ය.

19.5 විවාහක සාමාජිකයකු මිය යෑමේදී එම සාමාජිකයාගේ නීත්‍යානුකූල කලත්‍රයා එම සාමාජිකයාගේ ගෞරව පාරිතෝෂිකය ලැබීමට හිමිකම ලැබිය යුතු ය. එම සාමාජිකයාට නීත්‍යානුකූල කලත්‍රයකු නැත්නම් එම සාමාජිකයා විසින් නම් කරනු ලබන තැනැත්තා එම මුදල ලැබීමට හිමිකම් ලැබිය යුතු ය. යම් තැනැත්තකු නම් කරනු ලැබ නැති අවස්ථාවක එම ගෞරව පාරිතෝෂිකය ඉතා සුදුසු තැනැත්තකුට ගෙවීමට කළමනාකාර කමිටුවට බලය ඇත. මේ සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුව විසින් ගනු ලබන තීරනය අවසානාත්මක වේ.

19.6 (8) වන රීතිය යටතේ තම සාමාජිකත්වය අහිමිවන යම් සාමාජිකයකුගේ අවසන් ගිණුම බේරුම් කිරීම සඳහා (5.) වන රීතියේ 1 වන ජේදය යටතේ එම සාමාජිකයාගේ මාසික දායක මුදල් සහ (18.) වන රීතිය යටතේ පාරිතෝෂික මුදල් ප්‍රමාණවත් නොවන අවස්ථාවක ගෞරව පාරිතෝෂික මුදලින් අවශ්‍ය ප්‍රමාණය අඩු කර ගැනීම සඳහා පියවර ගැනීමට කළමනාකරණ කමිටුවට බලය ඇත.

19.7 ගෞරව පාරිතෝෂික ගනුදෙනු සම්බන්ධයෙන් (284 වන අධිකාරය වූ) ශ්‍රී ලංකා දුම්රිය නිළැ'දුම් අර්ථ සාධක අරමුදල් ආඥාපනතේ 23 වන වගන්තිය ප්‍රකාර කළමනාකරණ කමිටුව විසින් වෙනම ගිණුමක් පවත්වාගෙන යා යුතු අතර ගිණුමේ බැරට රුපියල් ලක්ෂ දහයක (රු.1,000,000/-) ඉතිරියක් පවත්වාගෙන යා යුතු ය.

19.8 (8.) වන රීතියේ 1 වන හෝ 2 වන ජේදයට අනුව සංස්ථාවේ සාමාජිකත්වය අවසන් වන සහ 19 වන රීතියේ 4 වන ජේදයේ (ආ) අනුජේදයේ අවශ්‍යතා සපුරා නොමැති සාමාජිකයකුට, එම සාමාජිකයා විසින් ගෞරව පාරිතෝෂිකයට ගෙවා ඇති සියලුම දායක මුදල් වල වාරික සහ එම වාරික මුදල් වල එකතුවෙන් සියයට දහයක් පොළිය වශයෙන් ආපසු ගෙවිය යුතු ය.".

4. (20) වන රීතිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් රීතිය ආදේශ කිරීමෙන් :–

"රැකවරණ පාරිතෝෂික.

(20.)1 සාමාජිකයකු මිය ගිය අවස්ථාවක, වයස අවුරුදු 18 ට අඩු සියලුම ගැහැණු සහ පිරිමි දරුවන්ට, එක් අයකුට රුපියල් පන් දහස (රු.5,000/-) බැගින් රැකවරණ පාරිතෝෂිකයක් ගෙවිය යුතු ය.

20.2 (20.) වන රීතියේ 1 වන ජේදය යටතේ එක් එක් දරුවා වෙනුවෙන් කරනු ලබන ගෙවීම්, මියගිය සාමාජිකයාගේ ගිණුම වසා දැමීමට පෙර සිදු කළ යුතු අතර ඒවා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වෙන් වෙන් වූ ස්ථිර තැන්පතුවල ස්වයංක්‍රීය අලුත්වීමේ කොන්දේසියට යටත්ව තැන්පත් කරනු ලැබිය යුතු ය. ස්ථිර තැන්පතු සහතික එක් එක් දරුවාගේ භාරකරු වෙත භාරදිය යුතු ය. බැංකුව විසින් කලින් කළ නිකුත් කරනු ලැබිය හැකි නියෝග හේතු කොට ගෙන ස්ථිර තැන්පතු ගිණුම් ආරම්භ කිරීමේ අපහසුතාවයක් ඇතිවුවහොත්, ඒ වෙනුවෙන් ඉතිරි කිරීමේ ගිණුම ආරම්භ කළ යුතු අතර රැකවරණ පාරිතෝෂික එහි තැන්පත් කළ යුතු ය.

20.3 (20.) වන රීතියේ 1 වන ජේදයට අනුව රැකවරණ පාරිතෝෂික ගෙවීම සඳහා (මෙහි මින්මතු "රැකවරණ පාරිතෝෂික ආරක්ෂක අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) රුපියල් ලක්ෂ පහක (රු.500,000/-) මුදලක් වෙනම ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කළ යුතු ය. එකී රැකවරණ පාරිතෝෂික ආරක්ෂක අරමුදල රාජ්‍ය බැංකුවක තැන්පත් කළ යුතු අතර එයින් ලැබෙන පොළිය, ඉදිරි වර්ෂ වල දී ගෙවනු ලබන රැකවරණ පාරිතෝෂික ගෙවීම සඳහා භාවිතා කරනු ලැබිය යුතු ය.".

5. (22) වන රීතියේ :–

(අ) 1 වන ජේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ජේදය ආදේශ කිරීමෙන් :–

"1. සාමාජිකයකු වශයෙන් එක් අවුරුද්දක කාල සීමාවක් සම්පූර්ණ කරන සාමාජිකයෙකුට පහත දැක්වෙන ආකාරයට ඔහුගේ සාමාජිකත්වය දරන කාලසීමාවට අනුරූප වන කාලසීමාව සඳහා විශේෂ ණයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

| අංකය | සාමාජිකත්වය දැරූ කාලය (අවුරුදු වලින්) | ණය මුදල (රුපියල් වලින්) |
|---|---|---|
| 1 | 01 - 05 | 7,500 |
| 2 | 05 - 10 | 15,000 |
| 3 | 10 - 15 | 20,000 |
| 4 | 15 - 20 | 30,000 |
| 5 | 20 ට වැඩි | 40,000" ; සහ |

(ආ) 5 වන ජේදයේ උපලේඛනය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් :–

"උපලේඛනය

| අංකය | ණය මුදලේ ප්‍රමාණය | මාස 6 කින් (වාරික 4 යි) | මාස 12 කින් (වාරික 10 යි) | මාස 18 කින් (වාරික 16 යි) | මාස 24 කින් (වාරික 22 යි) | මාස 36 කින් (වාරික 34 යි) |
|---|---|---|---|---|---|---|
| 1 | 7,500 | 1,875 | 750 | 475 x 15<br>375 x 1 | | |
| | | 141 | 113 | 106 | | |
| 2 | 15,000 | 3,750 | 1,500 | 940 x 15<br>900 x 1 | 685 x 21<br>615 x 1 | |
| | | 282 | 225 | 211 | 205 | |
| 3 | 20,000 | 5,000 | 2,000 | 1,250 | 910 x 21<br>890 x 1 | 590 x 33<br>530 x 1 |
| | | 375 | 300 | 282 | 273 | 265 |
| 4 | 30,000 | 7,500 | 3,000 | 1,875 | 1365 x 21<br>1335 x 1 | 885 x 33<br>795 x 1 |
| | | 563 | 450 | 422 | 410 | 398 |
| 5 | 40,000 | 10,000 | 4,000 | 2,500 | 1820 x 21<br>1780 x 1 | 1180 x 33<br>1060 x 1 |
| | | 750 | 600 | 563 | 546 | 530". |

6. (23.) වන රීතියෙහි 1 වන ජේදයේ (ආ) අනුජේදයට ඉක්බිතිවම (ඇ) සහ (ඈ) යන අලුත් අනුජේද එකතු කිරීමෙන් :–

"හිඟ මුදල්. 23. (ඇ) යම් සාමාජිකයෙකු, දුම්රිය දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ යෙදී සිටිය දී හෝ සේවයෙන් පහ කරනු ලැබූ විටක දී, හෝ මෙම සංයුක්ත අරමුදලට අයවිය යුතු යම්කිසි හිඟ මුදලක් වෙත්නම්, (6.) වන රීතියේ 1 සහ 2 ජේද යටතේ එවැනි සියලුම හිඟ මුදල් මෙම සංයුක්ත අරමුදලේ ලේකම් හා භාණ්ඩාගාරික විසින් ලිපියක් මගින් ඉල්ලීමක් කළ විට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් එකී සාමාජිකයාට ගෙවීමට ඇති ඕනෑම මුදලකින් අයකර දීමට අදාළ දෙපාර්තමේන්තුවට හෝ සංස්ථා ප්‍රධානීන්ට මෙම ව්‍යවස්ථාවේ ප්‍රකාර සම්පූර්ණ බලය ඇත්තේ ය.

(ඈ) එවැනි සාමාජිකයකුගේ බැරට මුදලක් එකී දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථාවේ නොමැති අවස්ථාවක් වෙත්නම් එම මුදල නීතිමය ක්‍රියාවලියක් මගින් අයකර ගැනීමට සංස්ථාවට බලය තිබේ.

7. (24.) වන රීතිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් රීතිය ආදේශ කිරීමෙන් :–

"ආරක්ෂණ පරිත්‍යාග.

(24.)1 ආරක්ෂණ පරිත්‍යාග ප්‍රතිලාභ ලබාගැනීම සඳහා මාස 6 ක සක්‍රීය සාමාජිකත්ව කාලයක් සපුරා තිබිය යුතු අතර ප්‍රතිලාභ ලබාගැනීමට ප්‍රථමයෙන් රුපියල් දෙසීයක (රු. 200/-) දායක මුදලක් ගෙවා තිබිය යුතු ය.

24.2 සම්පූර්ණයෙන්ම ස්ථිර අශක්නුතාවයකට පත්වන සෑම සාමාජිකයෙකුටම ආරක්ෂණ පරිත්‍යාග යටතේ රුපියල් විසිදහසක (රු.20,000/-) මුදලකට හිමිකම් ලැබිය යුතු ය. ස්ථිර අර්ධ අශක්නුතාවයක දී ඒ තැනැත්තාට ආරක්ෂණ පරිත්‍යාග යටතේ රුපියල් දස දහසකට (රු. 10,000/-) හිමිකම් ලැබිය යුතු ය.

24.3 මේ රීතියේ කාර්ය සඳහා :–

(අ) සම්පූර්ණ ස්ථිර අශක්නුතාව යන්නට පාද දෙකම නැතිවීම, අත් දෙකම නැතිවීම හෝ ඇස් දෙකම නැතිවීම හෝ ඒ කොටස්වල ක්‍රියාකාරීත්වය නැතිවීම ඇතුළත් වේ ; සහ

(ආ) ස්ථිර අර්ධ අශක්නුතාවය යන්නට එක් අතක් නැතිවීම, එක් පාදයක් නැතිවීම සහ එක් ඇසක් නැතිවීම හෝ ඒ කොටස් වල ක්‍රියාකාරීත්වය නැතිවීම ඇතුළත් වේ.

24.4 24 වන රීතියේ 2 වන ජේදයට අනුව ආරක්ෂණ පරිත්‍යාග ගෙවීම සඳහා ආරක්ෂණ පරිත්‍යාග අරමුදල වශයෙන් රුපියල් ලක්ෂ දහසක (රු.1,000,000/-) මුදලක් රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කළ යුතු ය. එකී ස්ථාවර තැන්පතුවෙන් ලැබෙන පොළී මුදල වාර්ෂිකව, ආරක්ෂණ පරිත්‍යාග ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කර ආරක්ෂණ පරිත්‍යාග ගෙවීම සඳහා උපයෝගී කරගත යුතු ය.

24.5 අනතුර සිදු වූ දිනයේ සිට දින 365ක් ඇතුළත රජයේ වෛද්‍ය නිලධරයකුගෙන් ලබාගත් වෛද්‍ය වාර්තාවක් සහ ඔහුගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් ලබාගත් අදාළ අනතුර පිළිබඳ වාර්තාවක් ද සමග ලිඛිතව පාලන කාරක සභාව වෙත කරනු ලබන ඉල්ලීමක් මත යම් සාමාජිකයෙකුට ආරක්ෂණ පරිත්‍යාගය ගෙවනු ලැබිය යුතු ය.

11 - 278

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.